<u>වැඩසටහන් වාර්තාව</u>

<u>පාසැල් පෙලපොත් කතෘවරුන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවේදීකරණ වැඩමුළුව</u>

- දිනය - 2018.10.16
- වේලාව - පෙ.ව.8.30 - ප. ව. 2.00
- සහභාගී වූ සංඛ්‍යාව - 57
- ස්ථානය - නිවාස සැලසුම් ගොඩනැගිලි මධ්‍යස්ථානය,නො 33,පාර්ලිමේන්තු පාර,පැලවත්ත,බත්තරමුල්ල






උක්ත වැඩසටහන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අශෝකා අලවත්ත මහත්මියගේ උපදෙස් මත ජාතික කාන්තා කමිටුවේ සභාපතිනිය ස්වර්ණා සුමනසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන ප්‍රකාශණ දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය විසින් ‘අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලා ප්‍රවාහ කිරීම’ යන මාතෘකාව යටතේ සහ කැළණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය අනූෂා එදිරිසිංහ මහත්මිය විසින් ‘පාසැල් පෙලපොත් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පය අන්තර්ග්‍රහණය කිරීම’ යන මාතෘකාව යටතේ තම දේශණ පවත්වන ලදි.‘The Grassrooted Trust’ ආයතනයේ අධ්‍යක්ෂ පබා දේශප්‍රිය මහත්මිය විසින් ‘සයිබර් අවකාශයේ කාන්තාවන් හා ළමුන් අපහරණය’ සම්බන්ධව කෙටි නමුත් කාලීන වැදගත්කමකින් යුත් දේශණයක් පවත්වන ලදි.

මෙම වැඩසටහන සංවිධානය කිරීමේ දී අධ්‍යාපන ප්‍රකාශණ දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල් ඩබ්ලිව්.ඩී.පද්මිණී නාලිකා මහත්මියගෙන් ලද සහය ඉතා අගය කොට සලකමු.

පාසැල් පෙලපොත් සැකසීමට සම්බන්ධව සෘජුවම ක්‍රියාත්මක වන නිලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධව සංවේදීකරණය මගින් පාසැල් පෙලපොත් වල අන්තර්ගතයෙහි තවදුරටත් ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම හා එමගින් අනාගතය උදෙසා හිංසනවලින් තොර සමාජයක් බිහි කිරීම මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය විය. අධ්‍යාපන අමාත්‍යාංශය නිලධාරීන් සමග මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ජාතික කාන්තා කමිටුව අපේක්ෂා කරයි.